# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 31 දරන ආදායම් බද්ද සම්බන්ධයෙන් අධිභාරය පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 මැයි මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 35 යි     තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1981 අංක 31 දරන ආදායම් බද්ද සම්බන්ධයෙන් අධිභාරය පනත

[සහතිකය සටහන් කළේ 1981 මැයි මස 15 වන දින]

එල්. ඩී.—ඕ. 83/80

**1980 අප්‍රේල් මස 01 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු නියම කරනු ලැබිය යුතු සෑම තැනැත්තකු සම්බන්ධයෙන්ම, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා ගෙවිය යුතු ආදායම් බද්ද අනුසාරයෙන් අධිභාරයක් පැනවීම පිණිස ද ඊට සම්බන්ධ හා ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1981 අංක 31 දරන ආදායම් බද්ද සම්බන්ධයෙන් අධිභාරය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනතෙහි "අදාළ වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන 1980 අප්‍රේල් මස 01 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු නියම කරනු ලැබිය යුතු සෑම තැනැත්තකු ම, වෙනත් යම් ලිඛිත නීතියක හෝ යම් සම්මුතියක, ප්‍රදානයක නැතහොත් ගිවිසුමක කුමක් සඳහන් ව ඇත ද, අදාළ වර්ෂය සඳහා ඔහු විසින් ගෙවිය යුතු මුළු ආදායම් බදු ප්‍රමාණයෙන් සියයට දහයකට සමාන අධිභාරයක් ගෙවීමට යටත් විය යුතු ය. අධිභාරය පැනවීම.

මේ වගන්තියේ කාර්ය සඳහා "ආදායම් බද්ද" යන්නට—

(අ) වාසික සමාගමක් සම්බන්ධයෙන් වූ විට, දේශීය ආදායම් පනතේ 33 වන වගන්තියේ (1 අ) උපවගන්තියේ (ආ) (ii) වන ඡේදය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද;

(ආ) නිර්වාසික සමාගමක් සම්බන්ධයෙන් වූ විට, දේශීය ආදායම් පනතේ 34 වන වගන්තිය යටතේ ඒ සමාගම විසින් ගෙවිය යුතු ආදායම් බද්ද අතුරින් ඒ වගන්තිය යටතේ සියයට තිස්තුනයි තුනෙන් එකක හෝ සියයට එකොළහයි නවයෙන් එකක අනුප්‍රමාණය මත ආගණනය කරනු ලබන ඒ කොටස

ඇතුළත් නොවිය යුතු ය.

3. 2 වන වගන්තිය යටතේ අධිභාරයක් ගෙවීමට යටත් සෑම තැනැත්තකු විසින් ම, ඒ අධිභාරයේ මුදලින් සියයට පනහකට සමාන හෝ ඊට වැඩි මුදලක් 1981 මැයි මස පහළොස්වන දින හෝ එදිනට පෙර ද එවැනි යම් අධිභාරයක ශේෂයක් වේනොත් ඒ ශේෂය 1981 නොවැම්බර් මස තිස්වන දින හෝ එදිනට පෙර ද කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවිය යුතු ය. අධිභාරය ගෙවීම.

A 55452-11,300 (81/03)

සේවා නියුක්තයන්ගෙන් අධිභාරය අඩු කර ගැනීම.

4. 1980 අප්‍රේල් මස 01 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, දේශීය ආදායම් පනතේ XV වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ තමාගේ සේවා නියුක්තියෙහි ඇති යම් තැනැත්තකුගේ පාරිශ්‍රමිකයෙන් ආදායම් බදු අඩුකර ගනු ලැබිය යුතු සෑම සේවායෝජකයකු විසින් ම, ඒ තක්සේරු වර්ෂය සඳහා ඒ සේවා නියුක්තයාගෙන් අඩු කර ගනු ලැබිය යුතු මුළු ආදායම් බද්දෙන් සියයට දහයකට සමාන මුදලක් 1981 අප්‍රේල් මාසයෙන් ආරම්භ වන සමාන මාසික වාරික අටකින් අඩුකර ගනු ලැබිය යුතු ය.

දේශීය ආදායම් පනතෙහි ඇතැම් විධිවිධාන අධිභාරය අඩු කිරීම, තක්සේරු කිරීම, අයකර ගැනීම සහ ගෙවීම සම්බන්ධයෙන් අදාළ විය යුතු බව.

5. සේවා නියුක්තයන්ගෙන් කර ගනු ලබන අඩු කිරීම්, තක්සේරු, ආදායම් බද්ද පිළිබඳ තක්සේරුවට විරුද්ධ අභියාචනා, ආදායම් බදු ගෙවීම සහ අය කර ගැනීම යන මේවාට අදාළ දේශීය ආදායම් පනතේ XV වන, XVII වන, XVIII වන, XIX වන, XX වන සහ XXI වන පරිච්ඡේදවල විධිවිධාන, 2 වන වගන්තිය යටතේ ගෙවිය යුතු අධිභාරය සේවා නියුක්තයන්ගෙන් අඩු කිරීම, තක්සේරු කිරීම, අධිභාරය පිළිබඳ තක්සේරුවට විරුද්ධව අභියාචනය කිරීම, අධිභාරය ගෙවීම සහ අය කර ගැනීම සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

ආපසු ගෙවීම.

6. අදාළ වර්ෂය සඳහා යම් තැනැත්තකුගෙන් නිසි පරිදි අය කර ගනු ලැබිය යුතු ආදායම් බද්ද ඉක්මවා, ඔහු විසින් ආදායම් බදු වශයෙන් ගෙවන ලද යම් මුදලක් ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තාට දේශීය ආදායම් පනතේ XXIII වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ හිමිකම් ලැබෙන අවස්ථාවක, 2 වන වගන්තිය යටතේ ගෙවිය යුතු අධිභාරය ඔහු ගෙවා ඇත්නම්, XXIII වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ආපසු ලබා ගැනීමට ඔහුට හිමිකම් ඇති මුදලෙන් සියයට දහයකට සමාන අතිරේක මුදලක් ද ආපසු ලබා ගැනීමට ඒ තැනැත්තාට හිමිකම තිබිය යුතු ය.

අර්ථ නිරූපණය.

7. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"දේශීය ආදායම් පනත" යන්නෙන්, 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත අදහස් වේ;

"ආදායම් බද්ද" යන්නෙන්, දේශීය ආදායම් පනත යටතේ පනවා අය කරනු ලබන ආදායම් බද්ද අදහස් වේ;

"කොමසාරිස් ජනරාල්වරයා", "සමාගම", "සේවා යෝජක", "සේවා නියුක්තයා", "තැනැත්තා" සහ "තක්සේරු වර්ෂය" යන යෙදුම්වල පිළිවෙලින් දේශීය ආදායම් පනතේ ඒවාට දී ඇති අර්ථ ම ඇත්තේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.